
# සිරි ගුනසිංහ - කොදෙව්වක මහද්වීපය

**මංජුල වෙඩිවර්ධන**



කොදෙව් සමාජය තුළට බුද්ධිය අන්තර්ග්‍රහණය වන්නේ නැත. මිත්‍යාව හෝ හිංසනය ත්වරනය වන්නේ නම් තර්කණය හෝ දැනුම මන්දනය වේ. ඉදින්, බුද්ධිගලනය ශ්‍රී ලංකාව නම් කොදෙව්වේ දැනුවත් ගැළවුම් මාර්ගයක් වී පවතී.

සිරි ගුනසිංහ යනු කොදෙව්වක පහළවුණු මහද්වීපයක් බව මම සිතමි. ඉදින් ඒ බර උසුලන්නේ කොහොමද? කොදෙව්ව විසින් ඔහු අහිමි කරගන්නේ ස්වයං කැමැත්තෙනි. ඉක්බිති සමාජය, ඔහු නැති අවකාශයක උපදින ශුද්ධ සංස්කෘතිය නම් මළදානයේ කුණු රසය තලු මරමින් රසවිඳියි. සැබැවින්ම නම්, ඔහු කැනඩාවේ පැළපදියම් වන්නේ නැත. ශ්‍රී ලංකාවේ අගතිගාමී සංස්කෘතික දේශපාලනික සන්දර්භය විසින් ඔහු කැනඩාගත කෙරෙනු ලැබෙයි.

සංස්කෘතිය දේශපාලනයේදී ඔහු පුරෝගාමියකු බුද්ධිමතකු, නිර්මාණකරුවකු මෙන්ම සවිඥානික චින්තකයෙක් විය. ඒ සකල පුරෝගාමීකම් වඩා නූතනවාදී විය. නමුත් සමාජය නූතනවාදයට හතුරුව පැවතිණ. නිදසුනක් ලෙස අපට වඩා සමීප කවියී යන විෂය ගතහොත්, නූතන සිංහල කවියේ * නූතන උපමාවේ, රූපකයේ, සංකල්ප රූපයේ පීතෘවරයා වූ සිරි ගුනසිංහයන්ගෙන් කවිය මුවහත් කර ගන්නට සමාජය විසින් අඛණ්ඩ වෙර දැරීමක් සිදුවූයේ නැති.

ඔවුන් විසින් නිර්මාණ භාවිතය තුළ සිදුකරන ලද්දේ "ණ ළ" අත්හැරීම හෝ "භාෂාවේ ද්වීරූපතාව" අතැර දැම්ම නොවේ. නූතනවාදී සාහිත්‍ය ප්‍රවේශයකදි වෙනස් කළ යුතුව තිබුණු එක් මූලික ප්‍රභේදයක් වූයේ "භාෂාවේ ව්‍යාකරණය" වෙනස් කිරීම නොව, "සාහිත්‍යයේ ව්‍යාකරණය" වෙනස් කිරීමයි. එතුළින්, "සමාජයේ ව්‍යාකරණය" වෙනස් කිරීමයි. එසේ ඉෂ්ඨ සිද්ධ කිරීමේදී විලංගුමය භාෂා ව්‍යාකරණයටද යන ගමන් පහර දීගෙන යන්නටී සිදුවේ. ඔහු විසින් "ණ ළ" අත්හැරීම හෝ "භාෂාවේ ද්වීරූපතාව" අතැර දැම්ම සිදුකෙරුණේ ජාතිකත්ව ගෝෂාවන්ට එරෙහි, නූතනවාදි අර්ථයකිනි. කෙළ සුවහස් විරිත් අතැඩර කවියට ප්‍රවේශවීමට ඔහුට ඕනෑ වූයේ ඡන්දස "ඕක්කාර" දෙන තරමට තොරොම්බල් වීමට එරෙහි දේශපාලන අර්ථයකිනි. ඒත් ඔහුගේ කවිය තුළ පවා සඳැස්මය ගති ලකුණු ශේෂ කිරීම තුළ ඔහු ධ්වනි නැංවෙන්නට සළස්වා ඇත්තේ කුමක්ද? එනම්,"සංස්කෘතික මහගෙයි වළං බිඳෙන ශබ්දය යි, ඔහුගේ කවිය ඉසියුම්ව විමසීම තුළින් මෙම ප්‍රවාදය පහදා ගනු හැකි බව මගේ අදහසයි.

විසිවන සියවස මුල යුරෝපීය සන්දර්භයක නූතනවාදය පැන නගින්නේ වුව සාහිත්‍ය හා කලාව යාවත්කාලීන වීමට නම් මෙම ඓතිහාසික ප්‍රවණතාවන් සාහිත්‍ය කලා වපසරියට පැමිණිය යුතු ය. නිදසුනක් ලෙස ලංකීය දෘෂ්‍ය කලා වපසරිය ගතහොත් එය කණ්ඩායමේ සාමූහික භාවිතය හා සංවාදය හරහා සමාජය තුළ පැවතුණි. සාහිත්‍යයික ක්ෂේත්‍රය තුළ වෙනත් ගුරුකුල කල්ලි කණ්ඩායම් පැවතියද, එහි නූතනවාදයක් පැවතුණේ නැත. සිරි ගුනසිංහ මස් ලේ නැති ඇට අබිමුඛ කරන්නේ එවන් සන්දර්භයකට ය.

1949දී සිරි ගුනසිංහ නිෂ්චිතව ම නිසඳැසී කැටුව පැමිණෙයි. 1949 ලංකා විශ්ව විද්‍යාලයේ සිංහල සමිතිය විසින් මුද්‍රණය කැරුණු අරුණී නම් සගරාවේ ආ පසුව් මැයෙන් ඔහු ලියූ කවියෙහි තැනෙක මෙසේ සඳහන් වෙයි.

**මගිය**
**ඇයි නිසල බව**
**මහ අතීතය හිම ගල් වී**
**ඉතිහාසයෙ බැමි ලිහි ලිහී**
**ඔබ වෙල වෙලා බඳී**
**වලගය කටින් ඩැහැගත්**
**කාලයේ නාගයා**
**ඔබ වටා දරන වැල ලා....**

ඒත්, පේරාදෙණිය තුළ වලී අධිනිෂ්චය වෙමින් පැවති කල්පනාලෝකවාදයකටී අබිමුඛ වූ ගුනසිංහමය ප්‍රවේශය හුදු පුද්ගල ප්‍රයත්නයක් * කැරැල්ලක් පමණක්ම විය. එතෙක් පැවති සම්භාව්‍ය හා වික්ටෝරියානු අදහස් මෙන්ම න්‍යායන්ද ප්‍රතික්ෂේප කරන නූතනවාදී සාහිත්‍යයික ස්ථාවරයක් තනිව දැරීමට නම්, නව නිර්මාණාත්මක සංකල්ප ජනිත කිරීමට විශාල විභවයක් සහ ජවයක් තිබීම අනිවාරණීය විය. සිරි ගුනසිංහට තිබුණේ එකී නිර්මාණාත්මක විභවය සහ ජවයයි. සාහිත්‍යය නූතනවාදය වෙතට ඇද දැමීමට නම් එකී අනම්‍ය බව අත්‍යවශ්‍ය භාවිතයක් බව ගුනසිංහයන් දැන සිටියේ ය. ඉදින් වැඩවසම් චින්තනය විසින් වගාදිගා කරන ලද ජාතිකත්වය හා ශුද්ධ සංස්කෘතිය පිළිබඳ මිත්‍යාවන්ට එරෙහිව හිටගැනීම අවශ්‍යයෙන්ම අතිශයින් රැඩිකල් ස්ථාවරයක් විය.

ඩපනස් හයේ පෙරළියී නමින් දෙමළ සමාජයට එරෙහිව ජතිකවාදය සංස්ථාපිත වන මොහොතේ ම, එනම් 1956දී, ඔහු මස් ලේ නැති ඇටඬ නමින් වන බුද්ධිමය බෝම්බය පුපුරුවා හැරියේ ය. පැවති වැඩවසම්වාදී ජාතිකවාදී ගතානුගතිකත්වයේ කෙළ සුවහසක් විරිත් බෙල්ලෙන් අල්ලා හෙල්ලූ සිරි ගුනසිංහ කවි ලියමින් නිහඬව සිටියේ නැත. ඔහු කොළඹ කවියේ මාරන්තික විවේචකයෙක් විය. කොළඹ කවිය මතුපිටින් ලස්සනට පෙනුනත්, ඒ කවි කියවා බැලූ කල අවසානයේ ගත යුත්තක් නැති බව ඔහු විවෘතව පැවසී ය. ඔහු ඒ පිළිබඳ ලියමින් විශාල මැදිහත්වීමක් කළේ ය. නිසඳැසී එනමින් නම් කෙරුණේ ගුනසිංහයන් අතිනි. මස් ලේ නැති ඇට කෘතියේ කවරයේ එය සඳහන් විය. ඔහුගේ ප්‍රවේශය, භාවිතය කෙළ සුවහසක් විරිත් අතැර සමුද්‍ර ගෝෂයේ සිරගතව සිටි කොළඹ කවීන්ගේ පමණක් නොව, වික්‍රමසිංහ, සරච්චන්ද්‍ර, අමරසේකර සාහිත්‍යයික රජ තුන්කට්ටුවේ ද උදහසට ලක්විය. වික්‍රමසිංහ විසින් පවා ගුනසිංහ වරනැගුණේ නරුමවාදියකු වශයෙන් වීම එහි පරිමානය වටහා ගැනීමට කැඩපතක් සපයයි.

සරච්චන්ද්‍ර වැන්නන් අමරසේකර මුරුංගා අතුවල නංවන විට එහි භයානක බව ඍජුව කියා පෑවේ ගුනසිංහ පමණි. අමරසේකරගේ යළි උපන්නෙමි නවකතාව ඉංග්‍රිසි, ප්‍රන්ස වැනි ජාත්‍යන්තර භාෂාවන්ට පරිවර්ථනය විය යුතු බව පැවසූ සරච්චන්ද්‍රහට ගුනසිංහ දීර්ග ලියුමක් ලියමින් අවධාරණය කළේ පක්ෂග්‍රාහී විචාරය සාහිත්‍යට හානියක් බවයි. යලි උපන්නෙමි දැනටම ඉංග්‍රීසියෙන් සහ ප්‍රන්ස බසින් පළ වී තිබෙන බව ලියා දැක්වූ ඔහු එහිදී උත්ප්‍රාසාත්මකව අවධාරණය කළේ ඩී.එච්. ලෝරන්ස්ගේ ඉංග්‍රීසි කෘති සහ ඕන්ද්‍රෙ ජීද්ගේ ප්‍රන්ස කෘති තුළ අමරසේකරියළි උපන්නෙමි වෙත ගෙන ආ වස්තූන් ගෙඩි පිටින් ඇති බව ය. එබැවින් එකී භාෂාවන්ගෙන් නවකතා කියවන්නන් තුළ අමරසේකරගේ ප්‍රබන්ධ ව්‍යායාමය චෙක් වෙන බැවින් එවැනි කෘතියක් එවන් බසකට නැගීම අර්ථ විරහිත බව ගුනසිංහයන් පැවසී ය.

මෙවන් බරපතල මැදිහත්වීම් නිසා සසල වූ සංස්කෘතික දේශපාලන අවකාශය, එනයින්ම, දේශපාලන සංස්කෘතිය තුළත් ඔහුගේ චින්තනයට අවකාශ තනා දෙන්නට පසුබට විය. නිදසුනක් ලෙස රටේ කේන්ද්‍රීය ප්‍රශ්නය වූ ජාතික ප්‍රශ්නය ගැන ඔහුට අඛන්ඩ අචපල ස්ථාවරයක් තිබිණ. තමන්ගේ ඇස අබියස සිදුවූ සිදුවීම් ගැන ඔහුට බරපතල දේශපාලන අදහසක් තිබිණ. දෙමළා පීඩාවට පත් කිරීම නවසිය පනස් අටටත් කලින් සිටි ඇති වූවක් බව ඔහු කීවේ ය. බෞද්ධයන් ද, ගාථා නොදන්නා සමාජයක, හින්දූන්ට බෞද්ධ ගාථාවක් කියා ගන්නට බැරිවුණායි පහර දුන් බව ඔහු මෙනෙහි කරලුයේ වේදනාවෙනි. එවන් සිද්ධි අවශ්‍යයෙන් ම යුද්ධයක් වෙත සමාජය රැගෙන ගිය බව ඔහු තර්ක කරයි. අවසන ඔහු මෙසේ කියයි. "යුද්ධය කියන්නෙ මිනිස්සු මිනිස්සු නොවන එක. මිනිස්සු වල් සත්තු බවට පත් වෙන එකී.

ඉදින්, කොදෙව් සමාජය ඔහුට එහි වසන්නට අවකාශයක් ඉතිරිකර දුන්නේ නැත. ඉදින් සමාජය විවර වූයේ සිරි ගුනසිංහ නැති සිංහ සමාජයකටී ය. ඔහුගේ පරම්පරාවේ අනෙකා වූ ගුණදාස අමරසේකර හදබසී වර නාමින් අඛන්ඩව තමන් ගත් මග ගනිමින් සිටියේ ය. නමුත් ඔහුට අබිමුඛවන්නට සිටි මහා කාව්‍යක්කාරයා නිහඬ වීමෙන් අමරසේකර චින්තනය සාහිත්‍ය*සමාජීය*දේශපාලන සංස්කෘතිය තුළ කෙමෙන් අධිනිෂ්චය වන්නට විය.

එක්වර ජාතිකවාදයටත්, අනෙක් පසෙන් ජනතාවාදයත් එනවිට, ඊට එරෙහිව හිටගන්නට සිරි ගුනසිංහයන් නො සිටි බව මට හැගෙයි. ඉදින් මා ඇතුළු, අපේ පරම්පරාව ඇතුළු වන්නේ ගුනසිංහ නැති "සිංහ" අවකාශයකට ය. මෙම අචපල නූතනවාදියා ක්‍රියාකාරීව සිටියේ නම් සාහිත්‍ය කලාවන් තුළ ජාතිකවාදය මෙන්ම ජනතාවාදය, මෙතරම් මුග්ධ ප්‍රවණතාවන් ලෙස හිස ඔසවන්නට ඉඩ නො තිබිණ. පේරාදෙණි බෙදුම තුළ, ඔහු වෙනුවෙන් පෙනී සිටි සමාන්තර සහෘද පරපුර හෝ ශිෂ්‍ය පරපුර ධෛර්සම්පන්නව හා අඛන්ඩව ඔහු ඇරඹූ සංස්කෘතික සටනෙහි නිමග්න නොවූ බව ඇත්තකි. මා ඇතුළු අප පරම්පරාව බිහිවූයේ ඒ රික්තකය තුළ ය.

මා පුද්ගලිකව හිතන්නේ මා ඇතුළු අපේ පරම්පරාව් නිදහස් කවියටී ප්‍රවිෂ්ඨය ගන්නේ පරාක්‍රම කොඩිතුවක්කුගේජනප්‍රියවාදී කවියෙන් බවයි. අනූව දශකයේ මූලාරම්භය වන විටම

